පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - විද්‍යාව

සතිය - ජනවාරි-I

ශ්‍රේණිය - 10

සැකසුම - W.A.D. ස්වර්ණකුමාරි මිය, කෑ/දෙහි/සිරිවර්ධන ම.වි.

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# ජීවයේ රසායනික පදනම

01. ජීවී දේහ තුළ පවතින මූලද්‍රව්‍ය සංඛ්‍යාව කොපමණද?

02. සජීව පදාර්ථයේ බහුලව පවතින මූල ද්‍රව්‍ය 04 නම් කරන්න.

03. කාබන් මූලද්‍රව්‍ය අඩංගු සංයෝග කාබනික සංයෝග වේ. කාබන් අඩංගු වුවද කාබනික සංයෝග ලෙස නොසැළකෙන සංයෝග දෙකක් නම් කරන්න.

04. සජීව පදාර්ථයේ අඩංගු මූලික කාබනික සංයෝග වර්ග 04 නම් කරන්න.

05. සජීව පදාර්ථයේ බහුලව හමුවන අකාබනික සංයෝග දෙකක් නම් කරන්න.

06. කාබෝහයිඩ්‍රේට්වල පොදු අණුක සූත්‍රය ලියා දක්වන්න.

07. කාබෝහයිඩ්‍රේට් වර්ගීකරණයට අදාළව පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

කාබෝහයිඩ්‍රේට්

| | | |
|---|---|---|
| මොනසැකරයිඩ | ................................... | ................................... |
| $C_6H_{12}O_6$ | $C_{12}H_{22}O_{11}$ | $(C_6H_{10}O_5)_n$ |
| 1ග්ලූකෝස්<br>2------------------<br>3------------------ | 1මෝල්ටෝස්<br>2------------------<br>3------------------ | 1පිෂ්ටය<br>2------------------<br>3------------------ |

08. මොනොසැකරයිඩවල ලක්ෂණ දෙකක් ලියන්න.

09. පැණිරස වැඩිම සහ පැණි රසක් නොමැති මොනොසැකරයිඩයන් පිළිවෙලින් ලියන්න.

10. ඩයිසැකරයිඩ නිපදවීමට අදාළ පහත සටහන සම්පූර්ණ කරන්න.

| |
|---|
| මොනසැකරයිඩ + ........................... ⟶ ඩයිසැකරයිඩ + .............................. |

11. මෝල්ටෝස්, සුක්‍රෝස් අඩංගු ආහාර එක බැගින් ලියන්න.

12. පොලිසැකරයිඩ වල විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

13. සතුන්ගේ සිරුර තුළ සංචිත කරනු ලබන කාබෝහයිඩ්‍රේටය නම් කරන්න.

14.කාබෝහයිඩ්‍රේට් වල වැදගත්කම් 04 ක් ලියන්න.

15. පහත ක්‍රියාකාරකම් ඇතුළත් වූ වගුව සම්පූර්ණ කරන්න.

| ක්‍රියාකාරකම | නිරීක්ෂණය |
|---|---|
| 1. පිෂ්ට පරීක්ෂාව<br><br>බත්ඇට වලට ජලය ස්වල්පයක් එක්කර පොඩිකර පරීක්ෂා නලයකට ගෙන අයඩීන් ද්‍රාවණ බිංදු කීපයක් දැමීම. | ..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>.......................................................................................... |
| 2. ග්ලූකෝස් හදුනාගැනීම.<br>..................................................................<br>..................................................................<br>.................................................................. | නිල්--- කොළ----කහ-----තැඹිලි ---- ගඩොල් රතු අවක්ෂේපය ලැබීම. |
| 3. සීනි ද්‍රාවණයකට සල්ෆියුරික් අම්ල බිංදු කීපයක් එක්කර රත්කර බෙනඩික් ද්‍රාවණය එක්කිරීම. | ..........................................................................................<br>..........................................................................................<br>.......................................................................................... |

16. කාබෝහයිඩ්‍රේට් හා ලිපිඩ වලට අමතරව ප්‍රෝටීනවල අන්තර්ගත මූලද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

17. ප්‍රෝටීන් අඩංගු ශාකමය ආහාර 02 ක් නම් කරන්න.

18.




මෙම ව්‍යුහය කුමක්ද?

19. ප්‍රෝටීන හදුනා ගැනීමේ පරීක්ෂාවේ නම ලියා පරීක්ෂාව විස්තර කරන්න.

20. එන්සයිම යනු මොනවාද?

21. ජලීය පාන් පිටි ද්‍රාවණයකට ඇමයිලේස් එන්සයිමය යොදා විනාඩි විස්සකට පසු ද්‍රාවණයට අයඩින් ස්වල්පයක් එක් කළ විට නිල් පාටක් නොවුණි නම් හේතුව පැහැදිලි කරන්න.

22. පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

| |
|---|
| මේද අම්ල + ........................ ⟶ .......................... + ජලය |

23. ලිපිඩ මගින් ජල සංරක්ෂණය සහ දේහ උෂ්ණත්වය පවත්වාගෙන යන අන්දම විස්තර කරන්න.

24. නියුක්ලෙයික් අම්ලවල අඩංගු මූලද්‍රව්‍ය මොනවාද?

25. නියුක්ලියෝටයිඩයක රූපයක් ඇඳ කොටස් නම් කරන්න.

26. නියුක්ලෙයික් අම්ලවල වැදගත්කම් පහක් ලියන්න.

27.පහත වගුවේ හිස්තැන් පුරවන්න.

| නියුක්ලෙයික් අම්ලය | තැනුම් ඒකකය | කාර්යය |
|---|---|---|
| DNA | | |
| RNA | | |

28. ආහාරයේ සංඝටකයක් ලෙස ජලය අඩංගු බව පෙන්වීමට පරීක්ෂාවක් විස්තර කරන්න.

29. ජලයේ සුවිශේෂී ගුණ හතරක් ලියන්න.

30. ජලය මිදීමේදී සිදුවන අසමාකාර ප්‍රසාරණය ජීවීන්ට වැදගත් වන ආකාරය විස්තර කර ලියන්න

31. ජලයේ ද්‍රාවක ගුණය ජීවීන්ට වැදගත් වන ආකාර දෙකක් දක්වන්න.